# නූතන මුදල් නෝට්ටුවල අන්තර්ගත සංකේත පිළිබඳ අධ්‍යයනයක්

(1980 වර්ෂයේ නිකුත් කළ නෝට්ටු කාණ්ඩයෙන් තෝරාගත් නොට්ටු කිහිපයක් ඇසුරින්)

කිරිඉබ්බන්ආරේ ධම්මාලංකාර හිමි

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
Keselpothawimala@gmail.com

**ප්‍රමුඛ පදඃ** මුදල් නොට්ටු, සංස්කෘතික උරුමය, 1980 දශකය, පුරාවිද්‍යාව

## හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අවශ්‍යතාය සඳහා හුවමාරු ක්‍රමය ආරම්භ වේ. එසේ ආරම්භ වූ මුදල් ව්‍යවහාරය, සංකේත භාවිතය, ලෝහ තහඩු භාවිතය සහ ලෝහවලින් නිෂ්පාදිත කාසි දක්වා වර්ධනය වේ. එහි උච්චතම අවස්ථාව මානවයා මුදල් නොට්ටු භාවිතයට යොමු වීමයි. ශ්‍රී ලංකාවේ විවිධ අවස්ථාවල මුදල් නොට්ටු කාණ්ඩ නිර්මාණය වූ අතර එහි දී 1980 වර්ෂයේ මුදල් නොට්ටු කාණ්ඩය විශේෂ වේ. එය ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක උරුමය තේමා කරගත් නෝට්ටු කාණ්ඩයකි. එම නොට්ටු කාණ්ඩයට රුපියල් 5, 10, 20, 50, 100, 500, 1000 ආදී නෝට්ටු අන්තර්ගත වේ.

මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස මුදල් නොට්ටුවල අන්තර්ගත සංකේතවල කොතෙක් දුරට ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සම්බන්ධ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක දෘෂ්ටිය සමාජගත වන්නේදැයි විමසා බැලීමයි. ඒ අනුව මුදල් නොට්ටුවල අන්තර්ගත විවිධ සංකේත මගින් ශ්‍රී ලංකාවේ පැරණි සමාජ විෂයෙහි පැවති දේශපාලනික, ආගමික, ආර්ථික, සාමාජික, හා සංස්කෘතික ගතිකයන් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ ලෙස පෙන්වා දිය හැකිය.

## ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද වාර්තා පිළිබඳව මූලිකව මෙහි දි අවධානය යොමු කෙරේ. මුදල් නොට්ටුවල අන්තර්ගත සංකේත හඳුනා ගැනීම සඳහා ඓතිහාසික මූලාශ්‍රය පරිශීලනයට මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයනය කටයුතු සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### 5 නෝට්ටුව

5 නෝට්ටුවේ මුහුණතෙහි ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වටදා ගෙවල් අතර ඉතා වැදගත් වටදාගෙයක් ලෙස සැලකෙන පොළොන්නරු වටදාගෙය සංකේත වේ. මෙය නියත වශයෙන්ම චෛතියඝර යනුවෙන් හඳුන්වන ස්ථූප වෙයි. මධ්‍යයේ සිව් දිශාවට මුහුණලා චෛත්‍යයක් වට කොට බුදු පිළිම හතරකි. පහළ වේදිකාවේ විෂ්කම්භය අඩි 120 උස අඩි 4.6කි. වටදාගෙයි පොදු ගෘහ නිර්මාණ ශෛලිය මැදිරිගිරිය වටදාගෙයට සමානකමක් දක්වයි. (සෙනෙවිරත්න 2004ඃ 142. 143) මෙම නෝට්ටුවේ මුහුණත අනුරාධපුර රත්තප්‍රාසාද මුරගලින් සරසා ඇත. අර්ධ උන්නත ශිල්පීය ලක්ෂණයෙන් යුක්ත වුවද නා රජු පූර්ණ උන්නතව දිස් වෙයි. තිවංක ඉරියව්වෙන් යුත් නා රජුගේ උඩුකයෙහි නගන භාවය එයට අලංකාරයක් විය. මෙහි යටිකය වසාලන දෝතිය දෙපා දක්වා වැටී ඇත. යටිකයේ සහ ඉග වටා

පැළඳි ආභරණ ඉතා සුන්දර කැටයම් මාලාවකි. නා රජුගේ හිස පැළඳි ඔටුන්න දිගටිය. මොහුගේ දකුණු අතේ වල්විදුනාවකි. වම් අතේ පුන් කලසකි. දොරටු පාලයා ගේ වම්පය පාමුල කුඩා වාමන පිළිරුවකි. මුරගලේ ඉහළ අර්ධ වෘත්තාකාර කොටස මැදින් දෙපස බලාගත් මකර මුඛ දෙකක් පෙම්වතුන් ගිල දමන අයුරු නිරූපණය වෙයි. (පෙරේරා 2007ඃ36).

10 නෝට්ටුව

මුහුණතෙහි කලිගුරට හේමමලා කුමරිය හා දන්ත කුමාරයා දළදා වහන්සේ රැගෙන එන ආකාරය නිරූපණය කරයි. 10 නෝට්ටුවේ පසුපස සිත්කළු භූමිභාගයක පිහිටි කැළණි විහාරය සිතුවම් කර තිබේ. බුදුරජාණන් වහන්සේ පන්සියයක් රහතන් වහන්සේලා පිරිවරා ගෙන වෙසක් මස පුරපසළොස්වක පොහොය දින කැලණියේ නා රජුගේ වාසභවනයට වැඩි සේක. එසේ වැඩමකර කැළණි චෛත්‍ය කර වූ ස්ථානයෙහි තනන ලද රතන මණ්ඩපයේ වැඩ සිටි අතර, නා රජු රසවත් ආහාරයෙන් සංග්‍රහ කරන ලදි, බුදුරජාණන් වහන්සේ ලෝකයා කෙරෙහි දයානුකම්පා ඇතිව ධර්මය දේශනා කරන ලදි. කැළණිය ස්තූපය ධාන්‍යාකාර හැඩයෙන් යුක්තය. (පෙරේරා 2007ඃ 184 - 185)

20 නෝට්ටුව

20 නෝට්ටුවේ මුහුණතෙහි අනුරාධපුර යුගයට අයත් සඳකඩ පහන දක්නට ලැබේ. මතුපිට සම්පූර්ණයෙන් ම කැටයම් කළ එම සඳකඩ පහන බිසෝ මාලිගයෙන් දැකිය හැකිය. 20 නෝට්ටුවේ පසුපස ලක්දිව ඉදිකරන ලද පළමු දාගැබ ථූපාරාමය දක්වේ. අනුරාධපුර යුගයට අයත් ථූපාරාමය දේවානම්පියතිස්ස රජු විසින් මිහිඳු හිමියන්ගේ උපදෙස් මත ඉදිකරවන ලදි. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව මෙම දාගැබ තුළ තන්පත් කර ඇති බව සිංහල බෞද්ධයින්ගේ පිළිගත් මතයකි. ථූපාරාම දාගැබ පොළෝ මට්ටමේ සිට අඩි 11 අගල් 4 ක් උස් වූ වෘත්තාකාර මළුවක් මත පිහිටා ඇත. එම වෘත්තාකාර මළුව අඩි 164 අගල් 6 ක විශ්කම්භයකින් යුක්තය. මේ අනුව දාගැබේ උස අඩි 63 කි. මළුවට පිවිසීම සඳහා උතුරින් හා දකුණු දෙසින් පමණක් පිටගැට පෙළ දෙකක් පිහිටුවා ඇත.

50 නෝට්ටුව

50 නෝට්ටුවේ මුහුණතෙහි කැලණිය ස්තූපය දක්වේ. කැලණිය ඓතිහාසික වශයෙන් මෙන්ම චිත්‍ර කලාවෙන් ද මහත් කීර්තියකට පත්ව ඇති විහාරස්ථානයකි. විහාරයට ඇතුළු වනවිට දකුණු පස පිහිටි විහාරයේ උඩරට චිත්‍ර කලා ආභාෂය කොටගත් චිත්‍ර වේ. විහාරයේ වම්පස සිතුවම් කොළඹ යුගය නියෝජනය කරයි. එම චිත්‍ර 1930 දී පමණ සෝලියස් මැන්දිස් සිත්තරා විසින් ඇඳ ඇත. ඔහු ලක්දිව ඓතිහාසික සිදුවීම් සහ කැලණිය හා සම්බන්ධ විශේෂ සිදුවීම් විශාල ප්‍රමාණයක් ඇඳ ඇත. (පෙරේරා 2007ඃ 184 - 185) 50 නෝට්ටුවේ පසුපස ලංකාතිලක ප්‍රතිමා ගෘහය දක්වා ඇත. මෙය අඩි 41ක් උසැති අති විශාල හිටි බුද්ධ ප්‍රතිමාවක් සහිතව මහා පරාක්‍රමබාහු රජු විසින් ගොඩනගන ලද්දකි. ලංකාතිලකයේ අභ්‍යන්තර ප්‍රතිමා ගෘහය දිගින් අඩි 26 ක් සහ පළලින් අඩි 13. 6 කි. මාවත දෙපස භූමියේ පොළොව අඩි 2.4 ක් වන අතර උස් වූ ඇතුළු මාවත හතරැස් පැතිකඩ හිසකින් යුක්ත ගල්කණුවලින් පරිපූර්ණ ය. එක් පසෙක කුළුණු 17 කි. ඒ මත දැවයෙන් නිර්මිත ඉහළ මාලය පිහිටා තිබෙන්නට ඇත. ඉහළ මාලයට ගොඩනැගීම පිණිස උතුරින් සහ දකුණින් ප්‍රවේශ ශාලාවේ සිට පියගැට පේළි දෙකක් වෙයි. (සෙනෙවිරත්න 2004ඃ 188 - 189)

### 100 නෝට්ටුව

100 නෝට්ටුවෙහි මුහුණතෙහි අනුරාධපුර හා පොලොන්නරුව යුගවලට අයත් කොරවක්ගල දැක්වේ. කොරවක්ගල කළුගල් හෝ හුණුගල් මධ්‍යයෙන් තනන ලද්දකි. එම පැතලි ගල් පුවරුවේ බාහිර හැඩය වක් සහිතය. එම ගලේ පැත්තකින් පිහිටුවා ඇති ව්‍යාජ කුළුණ මත හිඳගත් මකරාගේ මුඛයෙන් පිටව යන ලියවැල වක් හැඩයක් ගෙන ඇත. මකරා මනඃකල්පිත සත්ව නිර්මාණයකි. ඇත්සොඬ, සිංහපාද, කිඹුල් දත්, වඳුරකුගේ නෙත්, ඌරු කන් සහ මත්ස්‍ය කඳ සමඟ විචිත්‍ර පත්‍ර හෙවත් කොළවලින් සමන්විත වූ වලිගය ද යන මේ සත්වයින්ගේ කොටස් යොදා මකර රූපය නිර්මාණය කර ඇත. කොරවක්ගලේ මැද සත්ත්ව රූප, දේව විමාන, නාග කන්‍යාවන් වැනි රූප කැටයම් කළ අවස්ථාව ද ඇත. මේ අනුව ඉසුරුමුණිය කොරවක්ගලේ ඇතාගේ රූප ද, ලංකාතිලක කොරවක්ගලේ නාග කන්‍යා රූපය ද යොදා ඇති බව පෙන්වා දිය හැකිය. (පෙරේරා 2007ඃ 38 - 39) 100 නෝට්ටුවෙහි පසුපස නව පාර්ලිමේන්තු සංකීර්ණයෙහි සිතුවමක් දැක්වෙන අතර 1979 ජුලි 04 වන දින එවක අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මහතා මුල් ගල තැබූ අතර ගෘහ නිර්මාණ ශිල්පී ජීෆ්රි බාවා නම් නිර්මාණ ශිල්පියාගේ සැලසුමකට අනුව මෙය නිර්මාණය කර ඇත. වර්ෂ 1982 අප්‍රේල් මස 29 වන දින ප්‍රථම විධායක ජනාධිපති වූ ජේ.ආර් ජයවර්ධන ජනාධිපතිතුමා විසින් විවෘත කරන ලදි.

### ආශ්‍රිත ග්‍රන්ථ


*මහාවංශය* (1957) සංස්. බටුවන්තුඩාවේ. ආර්. රත්නාකර පොත් ප්‍රකාශකයෝ. කොළඹ.

*පුරාණයෙන් රූපියලට* (2013) ශ්‍රී ලංකා මහ බැංකුව. සන්නිවේදන දෙපාර්මේන්තුව.

පෙරේරා, ලාල් (2007) *චිත්‍ර කලාව.* හෙළදිව ප්‍රකාශකයෝ.